

සමනල් පැටියාගේ
ආසාව
සීතුල් නිසුර කාඩිගම

# සමනල් පැටියාගේ
# ආසාව

## සිතුල් තිනුර පාඬිගම

කතෘ

ශ්‍රී චන්ද්‍රානන්ද බෞද්ධ විදුහල
මහනුවර

### පිටකවරය සහ චිත්‍ර

සිතුලි කුලංගනා පාඬිගම

### කෘතිය පළ කරන දිනය

**2025 පෙබරවාරි 08**

ISBN - 978-624-208-620-0

# ස්තූතිය

මගේ ආදරණීය විදුහල්මෑණිය

ශ්‍රී චන්ද්‍රානන්ද බෞද්ධ විදුහලට,

මගේ අම්මා, අප්පච්චි, අක්කා ඇතුළු

මට උදව් කළ හැමෝටම

බොහොමත්ම පිං . . .

තෙරුවන් සරණයි !

# පිදුම

''අ'' යන්න ''ආ'' යන්න

කියලා දුන්න 1 වසර A

පන්තියේ මගේ දෙවනි අම්මා

මනෝරි ගුරුතුමියට, ලස්සන

රවිමාලි ගුරුතුමියට හා

මට ගොඩාක් ආදරේ

ගයාෂි ගුරුතුමියට

මේ පොත පිළිගන්වමි . . .

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම්පෑම එයට හේතුවයි. පාසල තළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මාහට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



එකමත් එක කාලයක ලස්සන සමනල පවුලක් හිටියා.




ඒ පවුලේ හිටියේ සමනල් අම්මයි, සමනල් අප්පච්චි, චූටි සමනල් පුතෙකුයි. මේ අය හරිම සතුටින් හිටියේ.




දවසක් මේ අම්මයි, අප්පච්චියි කතා වුණා චූටි පුතාව ඉස්කෝලෙකට යවන්න ඕනි කියලා. මෙහෙම කතා වෙලා කැලෑ ගමේ තියෙන ඉස්කෝලෙට මේ දෙන්නා ගියා.




චූටි චූටි සමනල් පැටවු, මී මැස්සෝ, බඹර පැටව්, පැණි කුරුල්ලෝ වගේ පුංචි සත්තු යන ඉස්කෝලෙට තමයි මේ සමනල් පුතාව දාන්න යන්නේ.



හැමදාම අම්මා, අප්පච්චි එක්ක සෙල්ලම් කරන චූටි සමනල් පුතාට ඉස්කෝලේ විස්තර අහලා හරිම සතුටුයි.




''අනේ මාව ඉක්මනට ඉස්කෝලේට යවන්න කෝ . . . මට හරිම ආසයි යාළුවෝ එක්ක සෙල්ලම් කරන්න'' චූටි සමනල් පුතා අම්මාට කීවා.



''ආ . . . ආ . . . ඉස්කෝලේ යන්නේ සෙල්ලම් කරන්න විතරක් නෙවෙයි පුතා හොඳට ඉගෙන ගන්න, හොඳ දේවල් දැනගන්න'' සමනල් අප්පච්චි කීවා.

''මම හොඳ දේවල් ඉගෙන ගෙන, උගන්නන ඒවත් හොඳට මතක තියාගෙන දවසක අම්මයි, අප්පච්චියි සතුටු කරන්නම් කෝ . . . '' සමනල් පුතා කීවා. සමනල් අම්මටයි, අප්පච්චිටයි හරි සතුටුයි.





ඔන්න ඉතිං සමනල් පුතා ඉස්කෝලේ යන දවස ආවා. උදෙන්ම ලෑස්ති වෙලා හරිම සතුටින් චුටි සමනල් පුතා එයාගේ අම්මයි, අප්පච්චියි එක්ක යන්න පිටත් වුණා.


ඉස්කෝලේ ඇතුළටම යනකොටම චූටි සමනල් පුතා ලස්සන පාට පාට මල් පිපිලා තියන ලොකු වත්තක් දැක්කා. ''අනේ ඒක හරිම ලස්සනයි''.



මට මේ වත්තෙන් මල් පැණි ඕනි තරම් බොන්න පුළුවන්ද අම්මා?'' සමනල් පුතා ඇහුවා. ''නෑ . . . නෑ . . . එහෙම බෑ ඔයාට ගුරුතුමිය කියන විදිහට ඒ වෙලාවට විතරක් තමන්ට ඇති ටික විතරයි බොන්න පුළුවන් වෙන්නේ''. සමනල් අප්පච්චි කීවා.



''ඉතින් අනේ අපි පුංචි ළමයිනේ . . . ඒ නිසා මේවා අපිට දෙන්න ඕනිනේ. අම්මයි අප්පච්චියි ගෙදර දී නම් හොඳම දේ හැමදේම මට දෙනවානේ. ගුරුතුමියටත් කියන්න මට ඒ වත්තේ හිතුන වේලාවට සෙල්ලම් කරන් පැණි බොන්න දෙන්න කියලා . . .'' චූටි පුතා අඬමින් කිව්වා. ''මගේ ලස්සන චූටි සමනල් පැටියෝ . . . එහෙම කරන්න බෑනේ. ඔයා වගේම චූටි යාළුවෝ ගොඩක් තව ඉන්නවා. එයාලටත් මේ හැමදේම අයිතියි. ඒ නිසා එයාලටත් ඉතුරු කරලා මල් ගස්වලට කරදර නැතිව පැණි බීල ගුරුතුමී කියල වෙලාවට විතරක් මෙතනට ඇවිත් අනිත් යාළුවෝ එක්ක සමඟියෙන් සතුටින් ඉන්න ඕනි. ඒවා ඉගෙන ගන්න තමයි අපි ඔයාව ඉස්කෝලෙට දැම්මේ'' සමනල් අම්මා පැටියාට තේරුම් කරලා දුන්නා.




මිහ් . . . මිහ් . . . මට තේරෙනවා දැන්. එතකොට මේ ඉන්න හැම පැටියෙක්ම මගේ යාළුවෝ ද? එයාලා මට කැමති වෙයිද?'' සමනල් පුතා දුකින් ඇහුවා. ''ඇයි නැත්තේ මගේ පුතා හරිම හොඳ සමනල් පැටියෙක්නේ. එහෙම අයට හැමෝම කැමතියි. ගුරුතුමිලත් කැමතියි. අර ඉන්න හැමෝමත් ඔයාගේ යාළුවෝ . . . ඔයත් ඒයාලත් එක්ක සතුටින් ඉන්න. යන්න එයාල ළඟට මගේ පුතාත්'' අම්මයි අප්පච්චියි කීවා.



පුංචි සමනල් පුතා සතුටින් එයාගේ යාළුවෝ ළඟට පියාඹාගෙන ගියා. සමනල් අම්මයි, අප්පච්චියි හරිම සතුටින් පුතා සෙල්ලම් කරන දිහා බලාගෙන හිටියා.

පුංචි අපි චූටි සමනල් පැටියා වගේ සතුටින් සහයෝගයෙන් ඉන්න ඕනි. හැමතැනදීම එතකොට හැමෝම අපිට ආදරේ වෙනවා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් දිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකකට සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘතික රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන්ය ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්